රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ :-07/2007

මගේ අංකය - ආ/2/3/2/70
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
**2007.05.28** දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## <u>රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව සිංහල හා දෙමළ යන භාෂා දෙකම රාජ්‍ය භාෂා වන බැවින් රජයේ සේවකයන්ට එම භාෂා දෙකෙන්ම කටයුතු කිරීමට හැකිවන සේ පහත සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කර ඇත.

(අ) 2007.07.01 දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුනු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 5 ක් තුළ ලබා ගත යුතුය.

(ආ) තනතුරුවලට පැවරෙන කාර්යභාරය අනුව අවශ්‍යවන දෙවන භාෂා ප්‍රවීණතාව පහත සඳහන් පරිදි මට්ටම් 3 කින් සමන්විත වේ. ඒ අනුව හඳුනාගනු ලැබූ සේවාවන් කිහිපයක් ඇමුණුම 1 හි සඳහන් වේ.

I. අ.පො.ස.( සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ ප්‍රධාන විෂයයන් ලෙස සමත්වීම (දෙවන භාෂාව හෝ වෛකල්පික විෂයයක් වශයෙන් නොවේ.) හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වන කථන විභාගයකින් සමත්වීම හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන විශේෂිත කුසලතා විභාගයෙන් සමත්වීම ඇමුණුමෙහි 1 වන කාණ්ඩය සඳහා අදාලවේ.

II. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත්වීම ඇමුණුමෙහි 2 වන කාණ්ඩය සඳහා අදාලවේ.

III. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන ප්‍රාරම්භක කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත්වීම ඇමුණුමෙහි 3 වන කාණ්ඩය සඳහා අදාලවේ.

(ඇ) කිසියම් තනතුරකට හෝ සේවාවකට අයත් නිලධාරීන් අතුරින් නිලධාරීන් කොටසකට ඔවුන්ට පැවරෙන රාජකාරි ස්වභාවය අනුව ඇමුණුම 01 හි දක්වා ඇති 2 හා 3 කාණ්ඩයේ ප්‍රවීණතා මට්ටමට වඩා ඉහළ ප්‍රවීණතා මට්ටමක් අවශ්‍යයැයි පත්වීම් බලධාරියා අදහස් කරන්නේනම්, ඒ පිළිබඳ නිර්දේශය අදල අමාත්‍යාංශයේ ලේකම් මඟින් ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර ප්‍රවීණතා මට්ටම තීරණය කරවා ගත යුතුය. ආයතන අධ්‍යක්ෂ ජනරාල් අවශ්‍ය ප්‍රවීණතා මට්ටම තීරණය කිරීමේදී රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ නිර්දේශයද ලබා ගනු ඇත.

(උදා:- ඇමුණුම 1 හි 14 යටතේ සඳහන් ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ කිසියම් තනතුරකට 3 වන කාණ්ඩයේ ප්‍රවීණතා මට්ටම ප්‍රමාණවත් නොවන්නේනම් කරුණු ඉදිරිපත් කර 1 හෝ 2 කාණ්ඩයේ ප්‍රවීණතා මට්ටමකට වෙනස් කර ගත හැක.)

(ඇ) ඇමුණුම 1හි සඳහන් සේවාවන්ට/තනතුරු වලට අයත් නොවූ සේවාවන්/තනතුරු සඳහා අදාල විය යුතු කාණ්ඩ තීරණය කිරීම ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කරනු ඇත. එසේ තීරණය කිරීමේදී ආයතන අධ්‍යක්ෂ ජනරාල් අදාල තනතුර අයත් අමාත්‍යාංශයේ ලේකම් හා රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විමසිය යුතුවේ.

02. පත්වීමේ දින සිට වසර 5 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

03. සියලුම සේවා ව්‍යවස්ථා හා බඳවාගැනීමේ පරිපාටි මේ අනුව සංශෝධනය කල යුතු අතර 2007.07.01 දින සිට සිදු කෙරෙන බඳවාගැනීම් සඳහා අයදුම්පත් කැඳවීමේ දැන්වීම්වල සහ පත්වීම් ලිපිවල මෙම විධිවිධාන ඇතුළත් කළ යුතුය.

04. 2007.07.01 දින හෝ ඊට පසු රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවාගැනීම් සඳහා පමණක් මෙම විධිවිධාන අදාලවන අතර ශ්‍රේණිගත උසස්වීම් හා රජයේ සේවකයන්ට පමණක් සීමාවූ සීමිත/කුසලතා වැනි බඳවාගැනීම් සඳහා අදාල නොවේ.

05. 2007.07.01 දිනට පසු බඳවාගනු ලබන නිලධාරීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2007 හි විධිවිධාන අදාල නොවේ.

06. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ එකඟතාවය අනුව මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

ඩී.දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

ඇමුණුම

| | සේවාවන් / තනතුරු | ලබාගත යුතු ප්‍රවීණතා මට්ටම | | |
|---|---|---|---|---|
| | | 1 කාණ්ඩය | 2 කාණ්ඩය | 3 කාණ්ඩය |
| 1 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | ✓ | | |
| 2 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | ✓ | | |
| 3 | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය | ✓ | | |
| 4 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | ✓ | | |
| 5 | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය | ✓ | | |
| 6 | දේශීය ආදායම් සේවය | ✓ | | |
| 7 | ශ්‍රී ලංකා තක්සේරු සේවය | ✓ | | |
| 8 | ශ්‍රී ලංකා විගණන සේවය | ✓ | | |
| 9 | අධිකරණ නිළධාරීන් | ✓ | | |
| 10 | ශ්‍රී ලංකා පොලිස් සේවයේ සහකාර පොලිස් අධිකාරී හා ඊට ඉහල ශ්‍රේණි | ✓ | | |
| 11 | නීති නිළධාරීන් | ✓ | | |
| 12 | ශ්‍රී ලංකා විදේශ සේවය | ✓ | | |
| 13 | ශ්‍රී ලංකා රේගු සේවය | ✓ | | |
| 14 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | | | ✓ |
| 15 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | | | ✓ |
| 16 | රජයේ වෛද්‍ය නිළධාරීන් හා දන්ත වෛද්‍ය නිළධාරීන් | | | ✓ |

| | සේවාවන් / තනතුරු | ලබාගත යුතු ප්‍රවීණතා මට්ටම | | |
|---|---|---|---|---|
| | | 1 කාණ්ඩය | 2 කාණ්ඩය | 3 කාණ්ඩය |
| 17 | ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | | | ✓ |
| 18 | දීප ව්‍යාප්ත සේවයට අයත් නොවන දෙපාර්තමේන්තුගත සේවාවල නිරත මාණ්ඩලික ශ්‍රේණිවල නිලධාරීන් | ✓ | | |
| 19 | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය | ✓ | | |
| 20 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය | ✓ | | |
| 21 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය හා ඒ හා සමාන දෙපාර්තමේන්තුගත සේවාවන් | | ✓ | |
| 22 | පොලිස් සේවයේ සහකාර පොලිස් අධිකාරී තනතුරට පහළ තනතුරු දරන නිලධාරීන් | | ✓ | |
| 23 | ග්‍රාම නිලධාරීන් | | ✓ | |
| 24 | ව්‍යාප්ත සේවාවල නියුතු සියළුම ක්ෂෙත්‍ර නිලධාරීන් (තාක්ෂණ සේවාව වැනි සේවාවන්) | | ✓ | |
| 25 | මහජන සෞඛ්‍ය පරීක්ෂක | | ✓ | |
| 26 | පිළිගැනීමේ නිලධාරී | | ✓ | |
| 27 | ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවය | | ✓ | |
| 28 | හෙද සේවය | | | ✓ |
| 29 | පවුල් සෞඛ්‍ය සේවය | | ✓ | |
| 30 | පුස්තකාලයාධිපති සේවය | | | ✓ |
| 31 | විදුහල්පති සේවය | ✓ | | |
| 32 | කණිෂ්ඨ කාර්ය මණ්ඩල | | | ✓ |